# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 158 — 1975 අප්‍රේල් මස 04 වැනි සිකුරාදා — 1975.04.04

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (IIආ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 413 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 418 | රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 419 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| තැපැල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 420 | විවිධ දැන්වීම් ... ... ... | 420 |


## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1975 අප්‍රේල් මස 24 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවේ ත්‍රිකුණාමල වරාය සංවර්ධන වැඩ බිමට ටෙන්ඩර් පත්‍රය සමග නිකුත් කළ ප්‍රමාණ පත්‍රයේ සඳහන් ගංගා වැලි සහ කළුගල් ප්‍රමාණයන් (චීන වරාය) සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1975 අප්‍රේල් මස 24 වෙනි දින පස්වරු 2.45 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නො එවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැත හොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 100ක මුදලක් වරාය කොමිෂන් සභා කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝරම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1975 අප්‍රේල් මස 23 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම කොළ නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස්.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1.
1975.03.24.

4-40—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

කොළඹ 2, තැ. පෙ. 509 දරණ ස්ථානයේ පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මෙහි පහත විස්තර කර ඇති පරිදි පොලිතීන් මලු සැපයීම සඳහා 1975.04.22 වැනි දින පෙරවරු 10.00 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පෙට්ටිය එදිනම දවල් 11.00 ට විවෘත කරනු ලැබේ.

අවශ්‍ය පොලිතීන් මලුවල ප්‍රමාණයන් සහ මුළු ගණන පහත දැක්වේ :—

| | ප්‍රමාණය | ඝණකම | පාට | අවශ්‍ය වැඩිම ගණන |
|---|---|---|---|---|
| 1 | 6" x 9" | 300 | විනිවිද පෙනෙන | 8,00,000 |
| 2. | 9" x 9" | 300 | විනිවිද පෙනෙන | 2,00,000 |

වැඩි විස්තර ආදිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

2. ඉහත සඳහන් ස්ථානයෙහි පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මත පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් සකස් කළ යුතුය. රුපියල් 200 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කිරීමේ රිසිට් පත ඉදිරිපත් කිරීමෙන් 1975.04.21 වැනි දින පස්වරු 3.00 දක්වා කාර්යාල වේලාවන් තුළදී මෙම ආකෘති පත්‍ර ලබාගත හැක.

3. ටෙන්ඩර් තැන්පත් මුදල් වන සංරක්ෂකගේ නමින් කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු ශාඛාවේ අංක 34 දරණ ගිණුමට ගෙවිය යුතුය. ගෙවීමට පෙර මෙම කාර්යාලයෙහි ගිණුම් අංශයෙන් මුදල් ගාස්තු වවුචරයක් ලබාගත යුතුය

එල්. සී. ඒ. ද එස්. විජේසිංහ,
වන සංරක්ෂක ජෙනරාල්.

කොළඹ 2.

4–89—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

#### හොරණ රජයේ ගොවිපලට පැළකිරීමට සුදුසු අඹ සැපයීම

පහත සඳහන් සැපයීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර්පත් 1975.4.21 දින දවල් 12 දක්වා කොළඹ ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ සභාපති විසින් භාරගනු ලැබේ:—

පැළකිරීම සඳහා මද ලබාගැනීමට සුදුසු ඉතා හොඳින් පැසුනු වල් අඹ හෝ කොහු අඹගෙඩි 50,000 ක් සපයා හොරණ රජයේ ගොවිපලට ගෙනැවිත් භාරදීමට. 1975 මැයි, ජූනි මාස තුළදී මේවා සැපයිය යුතුය.

2. ටෙන්ඩර් ෆෝරම මෙම කාර්යාලයෙන් ලබාගත යුතු අතර, එක් ටෙන්ඩර් ෆෝරමයක් සඳහා රු. 10 ක ටෙන්ඩර තැන්පත් මුදලක් පේරාදෙණියේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ එක් එක් දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති දි. කෘ. ව්‍යා. නි. කාර්යාලයක හෝ මුදලින් තැන්පත් කර මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කල යුතුය.

3. එම ටෙන්ඩර් ෆෝරම සම්පූර්ණ කොට කවරයක බහා ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලය, තැ. පෙ. 622, පළතුරු කම්හල පාර, කොළඹ 5 යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් ඒවා මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතුය. එවනු ලබන කවරයේ වම් කෙලවරේ "හොරණ ගොවිපලට අඹ සැපයීම" යන්න සඳහන් කල යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ඉල්ලුම්කරුවන්වද පැමිණ සිටිය හැකිය.

5. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගොවිපල්) සමග ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර ඒ සඳහා මුද්දර ගාස්තු තමන් විසින්ම දැරිය යුතුය.

6. එකී ගිවිසුම අත්සන් කිරීමට පෙරාතුව තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් කොන්ත්‍රාත්තුව නිසියාකාර ඉෂ්ට කිරීම සඳහා මුළු මුදලින් 5% ප්‍රමාණයක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් කෘෂිකර්ම අධ්‍යක්ෂ සරප් කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කර එම කුවිතාන්සිය මාවෙත ඉදිරිපත් කල යුතුය.

7. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ හා ටෙන්ඩරයක හෝ ටෙන්ඩර් වල කොටස් පමණක් පිළිගැනීමේ අවසාන බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුවේ.

8. වැඩිදුරටත් විස්තර හොරණ රජයේ ගොවිපලේ කළමනාකරු ගෙන් ලබාගත හැක.

එස්. තවරාජවේල්,
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති (ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලය)
කොළඹ 5.

1975. 03. 24 දින,
පළතුරු කම්හල පාරේ, තැ. පෙ. 622,
ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ දීය.

4–2—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

#### බතලගොඩ සහ වාරියපොල රජයේ ගොවිපලවල ලෙලි පොල් විකිණීම

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් බතලගොඩ ගොවිපලේ ලෙලි පොල් 45,000 ක් සහ වාරියපොල ගොවිපලේ ලෙලි පොල් 20,000 ක් විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1975. 05. 02 වන දින පස්වරු 2 වනතෙක් භාරගනු ලැබේ.

(1) පොල් විකිණීම සඳහා තෝරාගනු ලබන ටෙන්ඩර්කරුට ඒ බව දන්වා සති දෙකක් ඇතුලත දී ගොවිපලේ කළමනාකරුට සම්පූර්ණ පොල් තොගය සඳහා මුළු මුදල එකවර ගෙවා පොල් තොගය භාරගෙන ගොවිපලින් බැහැර කරගත යුතුය. මොනම හේතුවක් නිසාවත් පොල් තොග මිලදී ගැනීම සඳහා දෙනු ලබන කාලය නැවත දීර්ඝ කරනු නොලැබේ.

(2) පොල් තොග භාරගැනීමේ කිසිම පිළිවෙලකට වගී කිරීමකට ඉඩ නැත. එමෙන්ම පුහුවූ හෝ කුඩාවූ හෝ කුණුවූ වශයෙන් වගී කිරීමකටද ඉඩ නැත.

2. පේරාදෙණියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගොවිපල්) කාර්යාලයෙන් ලබාගන්නා ලද ෆෝරම්වල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, නිසි ලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා "පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති" නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි ඉහළ වම් කෙලවරෙහි බතලගොඩ සහ වාරියපොල ගොවිපලවල ලෙලි පොල් මිළට ගැනීම කියා සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝරම ලබාගත හැක. 75.05.02 වන දින පෙරවරු 10 වනතෙක් ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට පෙර රු. 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ එක් එක් දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති දි. කෘ. ව්‍යා. නි. කාර්යාලයක හෝ මුදලින් තැන්පත් කර කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය. ගිවිසුම් පත්‍ර අත්සන් කළ පසු මෙම මුදල ආපසු ගෙවනු ලැබේ. තෝරාගත් ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10ක් ඇතුලත අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවිනි නම්, ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තුව රාජසන්තක කරනවාත් හැර, ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරියවුන්ගේ නාම ලේඛනයට ඇතුලත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුගෙන් රජයට අයවිය යුතු යම් මුදලක් වේනොත්, එය අයකර ගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් මුද්‍රා තැබූ කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර "බතලගොඩ හා වාරියපොල රජයේ ගොවිපලවල ලෙලි පොල්මිලට ගැනීම" යනුවෙන්ද, ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද කවරයේ සඳහන් කොට "පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම

## පහල උවෙ සංවර්ධන වැඩ

බණ්ඩාරවෙල, ඌව දිසාවේ වැඩ අධ්‍යක්ෂ විසින්, පහල ඌව සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යෙදවිය හැකි පස් ඉවත් කිරීමේ උපකරණ සතු ලාංකිකයන්ගෙන්, ලාංකික ආයතන වලින් හෝ සමුපකාර සමිති වලින් පහත සඳහන් වැඩ සඳහා මිළ ගණන් කැඳවනු ලැබේ.

| වැඩ විස්තර | ඒකක ප්‍රමාණය | මිළ ගණන |
|---|---|---|
| (1) නියම කරන ලද පරිදි, මුල් ඉදිරීම හා සුන්බුන් හා අවශේෂ ද්‍රව්‍ය ඉවත් කිරීම ද ඇතුළුව සුළු කැලෑ එළිකිරීම ... | අක්කරය ... | ................... |
| (2) අඩි 7ක වට ප්‍රමාණයේ වැඩි ගස් හැර, නියම කරන ලද පරිදි මුල් ඉදිරීම, සුන්බුන් හා අවශේෂ ද්‍රව්‍ය ඉවත් කිරීමද ඇතුළුව මධ්‍යම ප්‍රමාණයේ කැලෑ එළිකිරීම ... ... ... ... | අක්කරය ... | ................... |
| (3) අඩි 7ක වට ප්‍රමාණයේ වැඩි ගස් හැර, නියම කරන ලද පරිදි මුල් ඉදිරීම, සුන්බුන් හා අවශේෂ ද්‍රව්‍ය ඉවත් කිරීමද ඇතුළුව විශාල කැලෑ එළිකිරීම ... ... ... ... ... | අක්කරය ... | ................... |
| (4) අනුමත කරන ලද පරිදි සැතපුම් ¼ක දුර ප්‍රමාණයක් පස් ප්‍රවාහනය කර වැව් බැමි, ඇල බැමි හා පාරවල් වල පස් තට්ටුවෙන් තට්ටුව පුරවා වතුර දමා තැලීම ... ... ... ... | කියුබය ... | ................... |
| (5) සැතපුම් ¼ට වැඩි හා සැතපුම් ½ දක්වා දුර ප්‍රමාණයක් පස් ප්‍රවාහනය කිරීම හා ඉහත (4) පරිදි පස්වැඩ ... | කියුබය | ................... |
| (6) සැතපුම් ½ට වැඩි හා සැ. ¾ දක්වා වූ දුර ප්‍රමාණයක් පස් ප්‍රවාහනය කිරීම හා ඉහත (4) පරිදි පස්වැඩ ... | කියුබය ... | ................... |
| (7) සැතපුම් ¾ට වැඩි හා සැ. 1 දක්වා වූ දුර ප්‍රමාණයක් පස් ප්‍රවාහනය කිරීම හා ඉහත (4) පරිදි පස්වැඩ ... | කියුබය ... | ................... |
| (8) මෘදුගල හාරා සැ. 0 සිට ¼ දක්වා වූ දුර ප්‍රවාහනය කර දමා තැවරීම— ... | | |
| (අ) අඩි 5ක් දක්වා ඔසවීම ... ... ... ... ... | කියුබය ... | ................... |
| (ආ) අඩි 5ට වැඩි හා අඩි 10 දක්වා ඔසවීම ... ... ... ... | කියුබය ... | ................... |
| (ඇ) අඩි 10ට වැඩි හා අඩි 15 දක්වා ඔසවීම ... ... ... ... | කියුබය ... | ................... |
| (9) මෘදුගල හාරා සැතපුම් 0 සිට ¼ දක්වා වූ දුර ප්‍රමාණයක් ප්‍රවාහනය කර අඩි 15ට වැඩියෙන් ඔසවා දමා තැවරීම ... | කියුබය ... | ................... |
| (10) මෘදුගල හාරා සැතපුම් ¼ට වැඩි හා සැ. ½ දක්වා වූ දුර ප්‍රමාණයක් ප්‍රවාහනය කර දමා තැවරීම— | | |
| (අ) අඩි 5ක් දක්වා ඔසවීම ... ... ... ... ... | කියුබය ... | ................... |
| (ආ) අඩි 5ට වැඩි හා අඩි 10 දක්වා ඔසවීම ... ... ... ... | කියුබය ... | ........... |
| (ඇ) අඩි 10ට වැඩි හා අඩි 15 දක්වා ඔසවීම ... ... ... ... | කියුබය ... | ................... |
| (11) මෘදුගල හාරා සැතපුම් ½ට වැඩි හා සැ. ¾ දක්වා වූ දුර ප්‍රමාණයක් ප්‍රවාහනය කර හා අඩි 15ට වැඩියෙන් ඔසවා දමා තැවරීම ... ... ... ... ... | කියුබය ... | ................... |
| (12) වෙඩි දමා කළුගල් කැඩීම හා ගොඩවල් ගැසීම. ගෙවීම් කරනු ලබන්නේ ගොඩවල් මතය— | | |
| (අ) අඩි 0 සිට අඩි 5 දක්වා ඔසවීම ... ... ... ... ... | කියුබය ... | ................... |
| (ආ) අඩි 5ට වැඩි හා අඩි 10 දක්වා ඔසවීම ... ... ... ... | කියුබය ... | ................... |
| (ඇ) අඩි 15ට වැඩි උසක් ඔසවීම ... ...... ... ... ... | කියුබය ... | ................... |
| (13) නියම කරන ලද පරිදි උඩපස අඟල් 12ක් ඝනකමට කපා ඉවත් කිරීම ... ... ... | කියුබය ... | ................... |
| (14) නියම කරන ලද පරිදි බිඳුණුකඩේ රොන් මඩ හා සුන් බුන් ඉවත් කිරීම ... ... ... | කියුබය ... | ................... |
| (15) නියම කරන පරිදි පිට වාන මාර්ගයේ පස් කැපීම (පිටවාන පහත් කිරීම) හා එම පස් ඉවත දැමීම සැතපුම් ¼ක් දක්වා වූ දුර ප්‍රමාණයන්ය ... ... ... ... ... | කියුබය ... | ................... |
| (16) නියම කරන පරිදි බැමි කානුව (Keytrench) කැපීම හා එම පස් ඉවත දැමීම. සැතපුම් ¼ක් දක්වා පස් ඇද දැමීමට | කියුබය ... | ................... |

2. මෙම මිල ගණන් ක්‍රියා කිරීමේ ගාස්තු, ඉන්දන හා ප්‍රවාහන කුළිය යනාදිය ඇතුළුව විය යුතුයි.

3. ඉහත පළමුවන ඡෙදයේ දක්වා ඇති වැඩ සඳහා මිළ ගණන්, වැඩ පටන් ගත හැකි දිනයද, සඳහන් කර 1975 අප්‍රේල් මස 28 වැනි දින දවල් 12.00ට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4. මිල ගණන් දක්වා එවනු ලබන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ '' පහල ඌව සංවර්ධන වැඩ සඳහා මිල ගණන් '' යන්න සඳහන් කළ යුතුය.

5. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර බණ්ඩාරවෙල, වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ මොනරාගල දිස්ත්‍රික් වැඩ අධ්‍යක්ෂ ගෙන් ලබාගත හැක. (දුරකථන අංකය බණ්ඩාරවෙල 527).

එන්. පී. තාමෝදරම්,
වැඩ අධ්‍යක්ෂ—ඌව දිසාව.

1975 මාර්තු මස 21 දින,
බණ්ඩාරවෙල,
දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ දීය.

4-8—75.04.84 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

## දිසාපති කාර්යාලය—මන්නාරම

මන්නාරම නානායම ඉඩමේ අමතර කාමර තුනක් ඉදිකිරීම සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන්, ග්‍රාම සංවර්ධන සමිතිවලින්, සමුපකාර සමිතිවලින් හා කම්කරු සමිතිවලින් මන්නාරම දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1975 අප්‍රේල් 18 සිකුරාදා දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. මන්නාරම දිසාපති කාර්යාලයේ උප දිසාපතිගෙන් ලබාගත් හා ලද ටෙන්ඩර් ආකෘති පත්වල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පිළිසෙල කළ යුතුය. ඔහුගෙන් අවශ්‍ය විස්තර හා තොරතුරු ලබාගත හැකිය.

3. යථෝක්ත 1 වැනි ඡේදයේ සඳහන් දිනට හා වේලාවට පෙර, මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති වෙත ලැබෙනසේ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ මන්නාරම දිසාපති කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් තුව සඳහා රු. 25 ක් ගෙවා කච්චේරි කුවිතාන්සිය සැපයීමෙන් 1975 අප්‍රේල් 17 බ්‍රහස්පතින්දා දක්වා ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කරනු ලැබේ. අනුමත වූ ග්‍රාම සංවර්ධන සමිති සමුපකාර සමිති හා කම්කරු සමිති තැන්පත් මුදල නොතබා ටෙන්ඩර් ආකෘතිපත් ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලුම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංක යනාදිය දැක්විය යුතුය.

එන්. ජයනාදන්,
මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති.

1975. 03. 19 වෙනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේ දීය.

4-29—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

### ධීවර දෙපාර්තමේන්තුව

මීගමුවේ අංක 45 දරණ ගොඩනැගිල්ල පිහිටි භූමියේ ගරාජයක් තැනීම හා භූමිය වටා කම්බි වැටක් ගැසීම සඳහා ධීවර අධ්‍යක්‍ෂ විසින් 75. 04. 18 දින පූ. භා. 10.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර 75. 04. 17. දින දහවල් 12 වන තෙක් කොළඹ 3, ගාළු මුවදොර ධීවර දෙපාර්තමේන්තුවේ ආයතන ශාඛාවෙන් ලබා ගත හැක. ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල රු. 100 කි.

ඒ. අයි. මොහිදීන්,
ධීවර අධ්‍යක්ෂ.

කොළඹ 3,
ගාලු මුවදොර,
ධීවර දෙපාර්තමේන්තුවේ දීය.

4-30—74.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

මාතලේ දිස්ත්‍රික්කයේ හෙට්ටිපොල ග්‍රාමීය රෝහලට යන්ත්‍රාගාරයක් සැපයීම හා ස්ථාපනය කිරීම.

ඉහත සඳහන් සේවය සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 75.05.16 වන දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර්කරුවන් විසින් මිළ සඳහන් කළ යුත්තේ තිබෙන තොගයෙන්, ආනයනය කරන තොගයෙන් හෝ ආනයනය කර සැපයීමටත් ය.

1975. 05. 15 වෙනි දින දවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනුපිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ රු. 150 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් / පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරන ලද ආකෘති පත්‍රය යටතේ නොමැති ටෙන්ඩර් පත් ගැන සලකා බලනු නොලැබේ.

3. සියලු ටෙන්ඩර් කවරයන් හි වම්පස ඉහළ කෙළවරේ "හෙට්ටිපොල රෝහලට යන්ත්‍රාගාරයක් සැපයීම සහ ස්ථාපනය කිරීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස ඉහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනට භාර දිය යුතුයි.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් ස්ථිර වුවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60ක් යනතෙක් ඒවා ආපසු ගන්වා ගත නොහැකිය.

6. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස්වීමක් වෙතොත්. ඒ බැව් සඳහන් කළ යුතුය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තකවනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නම ද ඇතුලත් වන්නේය.

8. කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 75.05.16 වැනි දින පෙරවරු 11.15 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

9. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

10. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැනගෙන් විමසන්න.

සී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ, 1975.03.24.
සිපී/2/369

4-75—74.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### තැපැල් ගෙනයාම සඳහා ටෙන්ඩර් කැඳවීම

ගොන් දෙදෙනෙකු බැඳි කරත්ත (කරත්තයේ ප්‍රමාණය දිග 6'9" පළල 6'0" උස 6'6" ට අඩු නොවිය යුතුය) මඟින් 1975 ජූලි 1 වැනි දින සිට 1977 ජූනි 30 වැනි දින දක්වා දෙවසක් තුළ ඉරිදා දිනට වවුනියාව දුම්රිය ස්ථානයේ සිට වවුනියාව තැපැල් කාර්යාලය දක්වා තැපැල් වාරය පමණක් හැර අන් සෑම දිනකදීම වවුනියාව දුම්රිය ස්ථානය හා වවුනියා තැපැල් කාර්යාලය අතර එක් දිසාවකට (ඉහළට හා පහළට) එක තැපැල් වාරය බැගින් පැවැත්වීම සඳහා එවනු ලබන ටෙන්ඩර්, කොළඹ 1, තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානයේ පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්යාලයේ තැ. හා. වි. ස. දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශිය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1975 මැයි 26 වැනි දින පෙ. ව. 10 වන තෙක් භාරගනු ලැබේ.

පෝස්ට්මාස්ටර් ජනරාල් තැනගෙන් ඉල්ලුම් කොට ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පිළියෙල කළ යුතුය. ඊට අදාල සියලු විස්තර ද ඔහුගෙන් ලබාගත හැක. රු. 10 ක් ගෙවා තැපැල් කාර්යාලයකින් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනුයේ 1975 මැයි මස 09 වැනි දින දවල් 12 වන තෙක් පමණි.

ඒ. ආර්. ඇම්. ජයවර්ධන,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ
විදුලි සංදේශ අධ්‍යක්ෂ.

පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්යාලය,
තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානය,
ඩියුක් වීදිය,
කොළඹ 1

4-78—74.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ, නො. 200, වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් ඇණ, මුරිච්චි සහ වොෂර් ආදී ද්‍රව්‍යයන් සැපයීම සඳහා 75 05.08 දින පෙරවරු 10 වනතෙක් සීල් තැබූ ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝර්මවල ලියා අනු පිටපතකින්ද යුක්තව එවිය යුතුයි. ඒ පෝර්ම කොල ටෙන්ඩර් විවෘත කරන දිනට පෙර දින දවල් 12 වනතෙක් පහත සඳහන් මගේ කායඨාලයෙන් ලබාගත හැක. මෙම පෝර්ම ලබා ගැනීමට ලං. ග. ම. ප්‍රධාන කායඨාලයේ ප්‍රධාන ගිණුම් නිලධාරිතැන වෙත ටෙන්ඩරය සඳහා රු. 100 ක් ද ආපසු නොගෙවන රු. 10 ක ටෙන්ඩර් පෝර්ම ගාස්තුපත්ද ගෙවා ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුවේ.

වැඩි විස්තර මගේ කායඨාලයෙන් වැඩ කරන වේලාවන්හිදී ලබා ගත හැක.

වානිජ කළමනාකාරතැන.

1975 මාර්තු මස 20,
වානිජ කොට්ඨාශය,
200, කිරුළ පාර,
කොළඹ 5.

4-83—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

**රැමින් මිශ්‍රණ, ෆෙපරෝ සිලිකන්, ෆෙපරෝ පොස්පරස් සහ වාතේ කැට සැපයීම සඳහා ටෙන්ඩරය**

ඉහත සඳහන් සැපයීම සඳහා ටෙන්ඩර් පත් 1975 මැයි මස 15 වන දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ. රු. 100 ක් ආපසු ලබා ගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් හා රු. 10 ක ටෙන්ඩර් පෝරම් ගාස්තුවක් ගෙවා අවශ්‍ය ටෙන්ඩර් පෝරම් කොළ මෙම කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩරය අවසන් වන දිනට පළමු වැඩ කරන දින දහවල් 12 ත් පසු භාර ගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පත් රු. 10 ක් ගෙවීමෙන් ලබාගත හැක.

විළට ගැණුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670
242, හැව්ලොක් පාර, කොළඹ 5.

4-87—75 04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

**ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය**

කොළඹ 7. අංක 415 බෞද්ධාලෝක මාවතේ. ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ, මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති විසින් මෙහි පහත සඳහන් දෑ සැපයීම පිණිස මුද්‍රා තබන ලද ටෙන්ඩර් කැඳවනු ලැබේ

| ටෙන්ඩර් අංකය | උවමනා ද්‍රව්‍ය කෙටියෙන් | ටෙන්ඩර් අවසාන දිනය හා වේලාව | ආපසු ගෙවන ටෙන්ඩර් ගාස්තු මුදලින් රු. ශ. | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු රු. ශ. |
|---|---|---|---|---|
| සීවී/එච්/70 | වෛද්‍ය උපකරණ | 24 04 75 | 100 0 | 5 0 |
| සීවී/එච්/71 | ආයුධ සහ උපකරණ | 05 05 75 | 100 0 | 5 0 |

ටෙන්ඩර් කොන්දේසි : ටෙන්ඩර් පත්‍රිකා සහ උපලේඛණ ආදිය පිළිබඳව වැඩිමනත් විස්තර සඳහා කොළඹ 7, අංක 415, බෞද්ධාලෝක මාවතේ, ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ. මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ ලේකම්ගේ කාර්යාලයෙන් ලබාගත යුතුය.

සභාපති.
මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය,
ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය.

තැ. පෙ 524,
කොළඹ 7,
1975 අප්‍රියෙල් මස 4 වෙනි දින.

4-84—75. 04. 04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**විදුලි වැටවල් සැපයීම සඳහා ටෙන්ඩර්**

පහත සඳහන් යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා 1975 05 12 වෙනි දින ප. ව. 1.30 තෙක් පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | සැපයීම විස්තර | ටෙන්ඩර් තැන් පත් මුදල |
|---|---|---|
| ඉඑන්ජී/එම්වී/2/6/75 | විදුලියෙන් ක්‍රියාකරවනවැටවල් 4 යි | රු. 25 |

වැඩි විස්තර සඳහා ඉංග්‍රීසි අනුවාදය බලන්න.

2. පේරාදෙනිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු (ඉංජිනේරු සේවා) කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර එම පිටපත් නිසියාකාරව සම්පූර්ණ කර අත්සන් තබා සීල් තැබූ කවරයක බහා එහි වම් උඩ කෙළවරේ "1975.05.12 දින ප ව 1 30 අවසන්වන විදුලි වැටවල් සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

4. 1975 මැයි මස 9 දින තෙක් පමණක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. ඉන්පසු ටෙන්ඩර් පත් නිකුත් කරනු නොලැබේ. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන්නේ රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් පේරාදෙනිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ එක් එක් දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි කාර්යාලයක හෝ මුදලින් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කළහොත් පමණි.

5. කිසිම වග විභාගයක් නොමැතිව. එවන ලද ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීම හෝ එම ටෙන්ඩර් පත සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් භාරගැනීමේ හිමිකම රජය සතුවේ.

6. වැඩි විස්තර පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු (ඉංජිනේරු සේවා) කාර්යාලයෙන් ලබාගත හැකියි.

එල් එස් එස්. ජයසුන්දර,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1975 මාර්තු මස 24 දින.
පේරාදෙනිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
ඉංජිනේරු කාර්යාලයේ දීය.

4-81—1975 04 04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය.

---

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

**ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ සබරගමුව දිසාවේ රත්නපුර සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල විධායක ඉංජිනේරු කොට්ඨාශවලට අයත් හිස් සිමෙන්ති මලු සහ හිස් තාර බැරල් මිළදී ගැනීම පිළිබඳව 1975 වර්ෂය සඳහා කැඳවන ලද ටෙන්ඩර් ප්‍රතිපල**

1974 නොවැම්බර් මස 01 වන දින ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය අනුව ටෙන්ඩර් පත් කැඳවන ලදුව මා විසින් ගත් අවසාන තීරණයන් මෙහි පහත සඳහන් කරමි:—

| වැඩය | ටෙන්ඩර් පියවූ දිනය | ලද මුලු ටෙන්ඩර් පත් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය | (*) පිළිගත් ටෙන්ඩරයේ මුදල (එකක්) බඩු ලබා ගන්නා ස්ථාන අනුව බඩු ලබා ගන්නා ස්ථාන (1) රු. ශ. | (2) රු. ශ. | (3) රු. ශ. | (4) රු. ශ. |
|---|---|---|---|---|---|---|---|
| රත්නපුර දිස්ත්‍රික්කයේ වි. ඉ කොටස්වලට අයත් හිස් සිමෙන්ති මලු මිළදී ඉවත් කර ගැනීම | 03.12.74 | 07 | කේ ආරුමුගම්. අංක 47/1 ඒ, 6 වන පටුමග, ශාන්ත ලූසස් විදිය, කොළඹ 13 | 0 88 | 0 80 | 0 78 | 0 78 |
| කෑගල්ල දිස්ත්‍රික්කයේ වි. ඉ කොටස්වලට අයත් හිස් සිමෙන්ති මලු මිළදී ඉවත් කර ගැනීම | 03.12.74 | 03 | එච් ඇම්. තහා, අංක 541, ඉනිගල, කටුගස්තොට | 0 91 | 0 90 | 0 88 | 0 84 |
| රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල හිස් තාර බැරල් මිළදී ඉවත් කර ගැනීම | 03.12.74 | 12 | ලැබුණු ටෙන්ඩර් පත් සියල්ල ප්‍රතික්ෂේප කළ අතර මේ පිළිබඳව නැවතත් ටෙන්ඩර් කැඳවනු ලැබේ. | | | | |

(*) පිළිගත් ටෙන්ඩර් මිළ—

1. විධායක ඉංජිනේරු කාර්යාලය
2. 1 සිට සැතපුම් 10ක් ඇතුලත
3. 1 සිට සැතපුම් 10ට වැඩි සැතපුම් 20ක් දුර ප්‍රමාණය සඳහා.
4. 1 සිට සැතපුම් 20ට වැඩිදුර ප්‍රමාණය.

කේ. වෙල්වරාජා,
වැඩ අධ්‍යක්ෂ. සබරගමුව දිසාව.

1975 මාර්තු මස 27 වැනි දින.
වැඩ අධ්‍යක්ෂ කාර්යාලය.
සබරගමු දිසාව. රත්නපුරය.

4-27—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම

### ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, දෙහිවල සතුන්ගේ සකස් කළ සම් හා පුරවන ලද හිස් වෙන්දේසියේ විකිණීම

පහත සඳහන් කරන, සතුන්ගේ, සකස් කළ සම් සහ පුරවන ලද හිස්, 1975 අප්‍රේල් මස 26 දින උදේ 10.00 ට, දෙහිවල ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තු භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

කළු කොටි සම් 2 යි,
රාජ නාගයා සම් 2 යි,
කිඹුලා සම් 1 යි,
පිඹුරා සම් 1 යි,
ගුවනාකෝ සම් 1 යි,
සිබ්‍රා සම් 3 යි,
ජපන් වලහා සම් 1 යි,
ජයන්ට් ඇන්ට් ඊටර් සම් 2 යි,
වෝපි හිස් 3 යි,
ස්ප්‍රිං බක් හිස් 1 යි,
බ්ලෙක් බක් හිස් 1 යි,
කඩා පැන්ඩා හිස් 1 යි.

අධ්‍යක්ෂගේ හෝ වෙන්දේසිය පැවැත්වීමට ඔහු විසින් නම කරන ලද නිලධාරියෙකුගේ හෝ අනුමත කිරීමට යටත්ව, වැඩි ලන්සුවක් නැබූ තැනැත්තා සාමාන්‍යයෙන් අදාල භාණ්ඩය මිලදී ගැනීමට හිමිකරු වනු ඇත. ලන්සු තබන්නන් අතර පැන නඟින ප්‍රශ්නයකදී වෙන්දේසිය පවත්වනු ලබන නිලධාරියාගේ තීරණය අවසාන තීරණය වේ.

වෙන්දේසිය අවලංගු කිරීමේ හෝ පුද්ගලයෙකු හෝ පුද්ගලයින්ගේ හෝ ලන්සුවක් ප්‍රතික්ෂේප කිරීමේ බලය අධ්‍යක්ෂ සතුවේ. මේ සම්බන්ධයෙන් හේතු දැක්වීමක් නො කෙරේ.

වෙන්දේසිකරුගේ යැඹුව අනුව, පිළිගන්නා ලද ලන්සුවේ සම්පූර්ණ මුදල ගෙවීමෙන් පසු, අදාල භාණ්ඩ/භාණ්ඩයක් භාර දෙනු ලැබේ.

මිලදී ගනු ලැබූ භාණ්ඩ, වෙන්දේසිය පවත්වනු ලබන දිනයේ සවස 5 ට පෙර, සත්ව උද්‍යාන භූමියෙන් ඉවත් කර ගත යුතුය. පසුව ගෙන යාම සඳහා සත්ව උද්‍යාන භූමියේ තබා යනු ලබන භාණ්ඩ ගැන වගකීම මෙම දෙපාර්තමේන්තුව භාර නොගනී.

1975 අප්‍රේල් 26 දින උදේ 8.30 සිට 10 දක්වා, වෙන්දේසියේ විකුණනු ලබන භාණ්ඩ බලා ගැනීමට ඉල්ලුම් කරුවනට ඉඩ දෙනු ලැබේ. භාණ්ඩ පිළිබඳව තමා සෑහීමට පත්විය යුතු අතර, කුමන හේතුවක් නිසාවත්, ලන්සුකරුවකුගෙන් භාණ්ඩයක් වෙනුවෙන් අයකර ගත් මුදල් ආපසු ගෙවනු නො ලැබේ.

ඩබ්ලිව්. එල්. ඊ. ද අල්විස්,
අධ්‍යක්ෂ.

ශ්‍රී ලංකා ජාතික සත්ව උද්‍යාන දෙපාර්තමේන්තුව,
අනගාරික ධර්මපාල මාවත,
දෙහිවල.

4-23—75 (4.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### රේගු වෙන්දේසිය

පහත සඳහන් බඩු 1975.04.24 වන දින පෙ.ව. 9.30 ශ්‍රී ලංකා රේගුවේ ගමන් බඩු කාර්යාලයේදී, වෙන්දේසියේ විකුණනු ලැබේ. මේ බඩු 1975.04.23 දින පෙ.ව. 10 සිට පස්වරු 3 දක්වා පිරික්සා බැලිය හැක. රේගු අයකැමි විසින් විකිණීම අනුමත කිරීමෙන් පසු විකුණන ලද බඩු ඒ වේලාවෙහිම මුළු මුදලම ගෙවා ගෙනයා යුතුය. රේගු විකිණීම් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වන දින රජයේ ගැසට් පත්‍රය බලන්න.

කේ. පී. එල්. පී. නානායක්කාර,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ගමන් බඩු විකිණීම් 4/75.
ශ්‍රී ලංකා රේගුවේ,
ගමන් බඩු කාර්යාලය, කොළඹ,
1975.03.17 දින.

(1) කලු පැහැති කුඩා පබළු පැකට් 20ක් (රු. 15) සහ සුදු පැහැති කුඩා පබළු පැකට් 19ක් (රු. 18).
(2) ළමා සෙල්ලම් අව් කණ්නාඩි දුසිම් 54ක්.
(3) එක පෙට්ටියක යතුරු කඩ 1000 ක් අඩංගු තරමක් මල බැඳුනු "ලීබ්‍රා" යතුරු කටුපෙට්ටි 25 ක්
(4) පෙට්ටියක බහාලන ඉන්දියන් පැලාස්ටික් පනා 115×12.
(5) පැට්‍රොමැක්ස් මැන්ටල් සවිකරන මැටි අමතර කොටස් 100ක්.
(6) රෙදි පාට කරන ඩයි පැකට් 6ක් (එකක කිලෝ ග්‍රෑම් 1කි).
(7) කලු සහ සුදු පැහැති කුඩා පබළු පැකට් 20ක් (රාත්. 19ක්).
(8) පාට රිබන් "බාවාන්" දුසිම් 2ක් (එකක මීටර් 11 කි) සහ පැළඳීමට ගන්නා "කාලි නූල්" කැරලි 53ක්.
(9) තරමක් මල බැඳුනු නො. 11—අඟල් 1 රූර් ඉබියතුරු 57×12, අඟල් 3/4, 7×12, නො. 55—අඟල් 3/4 විම්වෝ ඉබියතුරු 10×12.
(10) මල බැඳුනු අඟලේ රූර් ඉබියතුරු 430 ක්, අඟල් 3/4 විම්වෝ ඉබියතුරු 110ක්.
(11) රෙදි පාට කරන ඩයි පැකට් 7ක් (රු. 20ක්).
(12) කළු සහ සුදු පැහැති කුඩා පබලු පැකට් 5ක් (රු. 4ක්) අරුමෝසම් දම්වැල් 144ක් සහ පැකට් 4ක් (රු. 4ක්).
(13) රෙදි පාට කරන ඩයි පැකට් 3ක් (රු. 17ක්).
(14) රෙදි පාට කරන ඩයි පැකට් 11ක් (රු. 15ක්).
(15) කළු සහ සුදු පැහැති කුඩා පබලු පැකට් 10ක් (රු. 8 1/2ක්).
(16) යකඩ අත් පළඳනා 120ක් සහ රු. 1/2 ක අරුමෝසම් දම්වැල්.
(17) බයිසිකල් අමතර කොටස්— අඟල් 1/4ක යකඩ බෝල ග්‍රොස් 10ක පෙට්ටි 16ක්.
(18) අරුමෝසම් පළඳනා 82 ක් (තරමක් පාට වෙනස් වූ) සහ ලෝහ දම්වැල් රු. 6ක්.
(19) සෙල්ලම් අත් ඔරලෝසු 500ක්.
(20) ඇඳුම් ගාංචු පෙට්ටි 3×12.
(21) කලිසම් ගාංචු පෙට්ටි 8ක් (එකක ග්‍රොස් එකයි).
(22) අත් කොට බැනියම් 4ක්.
(23) කලිසම් ගාංචු රු. 8ක්.
(24) සුරුට්ටු සියක බහාලන ලද සෙයිකෝ තිය කපනයන් දුසිම් ...ස්, කලිසම් ගාංචු පෙට්ටි 11 ක් (එකක ග්‍රෝස් එකකයි) සුදුනූල් පන්දු 7ක්, තුම් කුම් පැකට් 12ක් (තරමක් පලුදුවූ) ඉබි යතුරු 8ක්.
(25) ලෝහ වලලු කුට්ටම් 2ක්.
(26) සීනුව වදින මේස ඔරලෝසුවක්.
(27) "මාර්පි" රිවඩ් ස්ත්‍රික්කයක්.
(28) පින්තූර අලවන පොතක්.
(29) මහතුන්ගේ කමිස 2ක් 14"—14½".
(30) මහතුන්ගේ කමිස 2ක් (ලොකු).
(31) රන් පැහැති සාරි බෝඩර් 24ක් (වරකට 6 බැගින්)
(32) මහතුන්ගේ කමිස 2ක් (15 1/2").
මහතුන්ගේ කමිස 2ක් (15").
මහතුන්ගේ කරවට පළඳනා ලේන්සු 6ක් සහ රේන්ද පටි රෝල් 3ක් (රු. 1 1/2ක් පමණ).
(33) සී කුවින්ස් වලින් වැඩ ලන ලද ගවුම් රෙදි කෑලි 10ක් (වරකට 2ක බැගින්)
(34) කොඩැක් එක්ටක්‍රෝම් පාට ඡේයා රූ පටි 5ක් (පිලම්ස්).
(35) මහතුන්ගේ කමිස 2ක් (13½")
(ii) මහතුන්ගේ කමිස 2ක් (14 1/2")
(iii) මහතුන්ගේ කමිස 1ක් (14).
(36) ක්‍රීඩා කමිස 4ක් (වරකට එක බැගින්).
(37) (i) මහතුන්ගේ කමිස 2ක් (14).
(ii) මහතුන්ගේ කමිස 2ක් (14½").
(iii) කාන්තා ක්‍රීඩා කමිස 3ක්
(iv) මහතුන්ගේ කමිසයක් (14").
(v) ගැහැණු ළමා ගවුමක්.
(38) මහතුන්ගේ කමිස 6ක් (වරකට 2 බැගින්).
(39) මහතුන්ගේ කමිසයක් (14½").
(40) පිදී නූලෙන් වැඩපු "දුප්පමාස්" රෙදි කෑලි 12ක් (වරකට 4 බැගින්) පන්ජාබි කමිස 5ක් (වරකට දෙක බැගින්).
(41) රිබන් පැකට් 5ක්.
(42) රන් සහ පිදී නූලෙන් වැඩපු සාරි බෝඩර් 32ක් (වරකට 6 බැගින්).

(43) සුදු රේන්ද පටි රෝල් 3ක් (රු. 1 3/4)
නිල් රේන්ද පටි රෝල් 1ක් (රු. 1/2)
කලු රේන්ද පටි රෝල් 1ක් (රු. 1/2)
රෝස හිරන්ද පටි රෝල් 1ක් (රු. 1/2)
රතු රේන්ද පටි රෝල් 1ක් (රු. 1/2) සූට් කේසයක් සමග

(44) සූට් කේසයක බහාලන ලද කර පළඳින නූල් මිටි 1ක්.

(45) අරුමෝසම් කරාබු කුට්ටම් දුසිම් 58ක්.

(46) පාවිච්චි කරන ලද කලිසමක්, ළමා කමිස 2ක්, බැනියම් 2ක්, සිහිනි ඇඳුම් කට්ටල 2ක්.

(47) රන් පැහැති නූල් රු. 6ක්.

(48) කළු කුඩා පබලු රු. 1 3/4ක්, කලු කර පළඳින නූල් මිටියක් රු. 1, රිබන් රෝල් 3ක්, හිස පැරසිලි 2ක්, පබලු පොටවල් 2ක්, කොන්ඩ කූදු 10ක්, ඉලාස්ටික් යාර 15ක්.

(49) පාපැදි ප්‍රිවිල් 4ක් සහ මැන්ටල් 8ක්.

(50) සෙල්ලම් ඇස් කණ්ණාඩි 45ක්, ප්ලාස්ටික් වළලු ජෝඩු 65ක්.

(51) අයි. සී. අයි. රෙදි පාට කරන "බයි" කිලෝ 1/2ක්.

(53) (i) පිදියෙන් වැඩ ලු ජෝජට් සාරියක්,
(ii) කෘත්‍රිම සේද සාරි 2ක් (කිලිටිවූ)
(iii) ක්‍රීඩා කමිසයක් කොන්ඩ පැරසිලි 2ක් කරාබු කුට්ටම් 2ක්, සූට් කේසයක් සමග.

(54) "සිමිසන්" ට්‍රාන්සිස්ටර් - බිත්ති ඔරලෝසුවක්.

(55) (i) පින්තූර අලවන පොතක්.
(ii) පින්තූර අලවන පොතක්.

(56) පාට වීදුරු 5ක කට්ටලයක්.

(57) කුඩා ස්ත්‍රික්ක 3 ක්.

(58) පිලිප් ඇඩ්එල් 076 "කුඩා ගුවන් විදුලි යන්ත්‍රයක් සහ එලිය විහිදෙන බුබුලු 3ක්".

(59) මෝටර් රථ ආමචර් එකක්.

(60) (i) මහතුන්ගේ කමිස 2ක්. (ii) මහතුන්ගේ ක්‍රීඩා කමිසයක්.

(61) චීන බූමිතෙල් උදුනක්.

(62) තරංගමාලා 5ක, ආර් 531 බී වර්ගයේ නැෂනල් පැනසොනික් "ට්‍රාන්සිස්ටර්" රේඩියෝවක්.

(63) ආර් කිව් 4165 "නැෂනල්" පැනසොනික් කැසට් රෙකෝඩරයක්.

(64) "රොන්සන්" ගියර්ට් ලයිටර් 1ක් සහ සැප් වියුබ් 1ක්.

(65) මේස් කුට්ටම් 4ක්.

(66) සූට් කේසයක් යතුරත් සමග.

4-3—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව—බටහිර දිසාව

දැව වෙන්දේසිය

තොග අංක 8 කින් යුත් මිඩෙල්, කීනිය, මලබඩ, පනුදත්, වල් දෙල්, වැවරන, පතිරාජ, මිල්ල, කුඹුදවුල, දුන්, හොර, මී, අතුකැපිය, හෙරලු හැලඹ, ලිරුත සඳුන් සහ ගුරු දැව ඝන අඩි 408.2 ක් ද, තොග 1 කින් යුත් 1 පන්තියේ වටකඳු 57 ක් ද, තොග 1 කින් යුත් කම්බි කනු 382 ක් ද, තොග 37 කින් යුත් පොරව 10 ක් ද, බාල්දි 4 ක් ද, උදලු 18 ක් ද, කුඩා 17 ක් ද, යකඩ 5 ක් ද, ගැරුම් වට්ටි 9 ක් ද, පිහියා 3 ක් ද, හෝනි 5 ක් ද, 1975 අප්‍රේල් 10 දින පෙරවරු 9 ට බටහිර දිසාවේ දිසාවන නිලධාරි විසින් ඇඹිලිපිටිය අඩවි වන කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුනනු ලැබේ.

මෙම වෙන්දේසියට ප්‍රථම දැව හා භාණ්ඩ බලා සෑහීමකට පත්වන ලෙස ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. වෙන්දේසිය පිළිබඳ වැඩිදුර විස්තර බටහිර දිසාවේ දිසාවන නිලධාරි වෙතින් හෝ ඇඹිලිපිටිය අඩවි වන නිලධාරිගෙන් ලබාගත හැක.

එච්. ආර්. පීරිස්,
දිසාවන නිලධාරි—බටහිර දිසාව.

දිසාවන කාර්යාලය,
රත්නපුර.

4-28—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව

1974 ඔක්තෝබර් මස 25 දින රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද "රාජ්‍ය ඉස්කාගාර සංස්ථාවෙන් කෙරෙන අරක්කු සැපයීම පිළිබඳ නියමයන් හා කොන්දේසි" වලට පහත සඳහන් කොන්දේසිය ද ඇතුළත් විය යුතුය.

"රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව" යන පාඨය යොදා ඇති බූමි දෙකක් බෝතල් 1975 අප්‍රේල් මස 1 දින සිට නිකුත් කෙරෙන අතර, ඒවා රාජ්‍ය ඉස්කාගාර සංස්ථාවේ දේපළ විය යුතුවාක් මෙන්ම නිරපේක්ෂකවම බෝතල් අරක්කු සැපයීම සඳහා පාවිච්චි කළ යුතුය. "රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව" යන පාඨය සහිත බූමි දෙකේ බෝතල් හැර අන් කිසිදු ලකුණක් ඇති බෝතල් ගුදමක දී භාර නොගන්නාක් මෙන්ම ඉන් නිකුත් නොකෙරෙනු ඇත.

බී. ඩබ්ලිව්. පෙරේරා,
සභාපති,
රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව.

1975 මාර්තු මස 24 දින,
අංක 10, වෝඩ් පෙදෙස,
කොළඹ 7.

4-90—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

## විවිධ දැන්වීම්

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා සැපයීම්කරුවන් ලියාපදිංචි කිරීම

මෙහි පහත අත්සන් කරනු ලබන අය විසින් ගාල්ලේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දකුණු කොට්ඨාශයේ, ගාල්ල, මාතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුළ දේශීය ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා සැපයීම්කරුවන් ලෙස ලියාපදිංචි කිරීම පිණිස අයදුම්පත් භාරගනු ලැබේ.

2. අයදුම්කරුවන් ලියාපදිංචි කිරීම පිණිස අයදුම් පත් එවන විට පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය:—

(අ) අයදුම්කරුගේ මුදල්මය ස්ථිරත්වය පිළිබඳ ප්‍රදේශයේ ප්‍රා. ආ. නි. ගෙන් වාර්තාවක්.

(ආ) කලින් ලත් පළපුරුද්දක් හා රජයේ දෙපාර්තමේන්තුවලට සාර්ථකව ද්‍රව්‍ය සපයා තිබේ නම් ඒ ගැන යම්කිසි ඔප්පු කිරීමක්.

(ඇ) ප්‍රවාහනය සඳහා තමන් සතු වාහන, ඒවායේ ලියාපදිංචි අංක හා ප්‍රමාණය ඔප්පු කිරීමත්.

3. අයදුම්පත් පෞද්ගලිකව හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ගාල්ල ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දකුණු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු වෙත 1975 ක්වූ අප්‍රේල් මස 24 දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.

එස්. යූ. එස්. ජයසුන්දර,
අධිකාරි ඉංජිනේරු, දකුණු කොට්ඨාශය.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
ගාල්ල, 1975. 01. 24.

4-5—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 8.30 සිට පස්වරු 2.45 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමඟම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන් කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන් සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 01 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කිරීමේ දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන්, කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1968.12.01 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... ... | 43 | 50 | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ රු. | ශ. | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 60 | 0 | 15 |

දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛණයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලග ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වෙනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1975**

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| මාර්තු ... | 07.03.75 | සිකුරාද ... | 26.02.75 | බදාද | දවල් 12.00 |
| | 14.03.75 | සිකුරාද ... | 05.03.75 | බදාද | දවල් 12.00 |
| | 21.03.75 | සිකුරාද ... | 12.03.75 | බදාද | දවල් 12.00 |
| | 27.03.75 | බ්‍රහස්පතින්ද ... | 19.03.75 | බදාද | දවල් 12.00 |
| අප්‍රේල් ... | 04.04.75 | සිකුරාද ... | 25.03.75 | අඟහරුවාද | දවල් 12.00 |
| | 11.04.75 | සිකුරාද ... | 02.04.75 | බදාද | දවල් 12.00 |
| | 18.04.75 | සිකුරාද ... | 09.04.75 | බදාද | දවල් 12.00 |
| | 24.04.75 | බ්‍රහස්පතින්ද ... | 16.04.75 | බදාද | දවල් 12.00 |
| මැයි ... | 02.05.75 | සිකුරාද ... | 23.04.75 | බදාද | දවල් 12.00 |
| | 09.05.75 | සිකුරාද ... | 30.04.75 | බදාද | දවල් 12.00 |
| | 16.05.75 | සිකුරාද ... | 07.05.75 | බදාද | දවල් 12.00 |
| | 23.05.75 | සිකුරාද ... | 14.05.75 | බදාද | දවල් 12.00 |
| | 30.05.75 | සිකුරාද ... | 21.05.75 | බදාද | දවල් 12.00 |
| ජුනි ... | 06.06.75 | සිකුරාද ... | 28.05.75 | බදාද | දවල් 12.00 |
| | 13.06.75 | සිකුරාද ... | 04.06.75 | බදාද | දවල් 12.00 |
| | 20.06.75 | සිකුරාද ... | 11.06.75 | බදාද | දවල් 12.00 |
| | 27.06.75 | සිකුරාද ... | 18.06.75 | බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.